සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

දෙවන වාර ඇගයීම - 2018
**Second term Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 09 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / **Paper**: **I,II** | කාලය / காலம் / **Time**: පැය 02යි. |

නම :- ........................................................................................ විභාග අංකය :- ...........................

**සැලකිය යුතුයි:**

*** I කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.**

*** II කොටසට අදාළ පිළිතුරු වෙනම කඩදාසියක ලියා පළමු කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.**

## I කොටස

❖ **අංක 01 සිට 20 දක්වා සියලු ම ප්‍රශ්නවලට වඩාත් සුදුසු පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) මෙරට මුහුදුබඩ ප්‍රදේශ යටත් කරගත් ලන්දේසීන්ගේ මව්රට කුමක් ද?
(1) පෘතුගාලය (2) ඕලන්දය (3) ප්‍රංශය (4) බ්‍රිතාන්‍ය

(02) ඉන්දියානු සාගරයේ තම වෙළඳ බලය ගොඩනැගීමේදී ලන්දේසීන්ට සටන් කිරීමට සිදුවූයේ කුමන ජාතියක් සමඟ ද?
(1) පෘතුගීසි (2) ඉංග්‍රීසි (3) මුස්ලිම් (4) ඉන්දියානු

(03) පළමුවන විමලධර්මසූරිය රජු හමුවීමට පැමිණි පළමු ලන්දේසි ජාතිකයා කවුරුන් ද?
(1) කලන් අල්බස් (2) ජෙරාඩ් හල්ෆ්ට්
(3) සිබෙල් ද වර්ට් (4) ජොරිස් වැන් ස්පීල් බර්ජන්

(04) අපරාධ නඩු විසඳීම ප්‍රධාන කාර්ය වූ ලන්දේසීන් විසින් පිහිටුවන ලද ඉහළම උසාවිය කුමක් ද?
(1) රාද් වැන් ජස්ටිට් (2) සිවිල් රාද්
(3) ලැන් රාද් (4) පිස්කල් උසාවි

(05) ලන්දේසි පාලන සමයේ මෙරට සිදුකළ ආර්ථික වෙනස්කම් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
A - මහබද්දේ දෙපාර්තමේන්තුව වෙනම කපිතාන්වරයකු යටතට පත්කර කාර්යක්ෂම කිරීම
B - පවුල්, ඉඩම්, පාසල් වශයෙන් තෝම්බු වර්ග තුනක් පිළියෙල කිරීම
C - ආගම් ප්‍රචාරය සඳහා ඉස්කෝල නම් ආයතන ආරම්භ කිරීම
D - මුතුරාජවෙල අස්වැද්දීමට කටයුතු කිරීම
(1) DCB (2) ABC (3) ABD (4) ACD

(06) ක්‍රි.ව. 1798 වර්ෂයේ දී ශ්‍රී වික්‍රම රාජසිංහ නමින් උඩරට රජකමට පත් වූයේ කවුරුන් ද?
(1) මුත්තුසාමි කුමරු (2) කන්නසාමි කුමරු
(3) කුණ්ඩසාලේ කුමරු (4) මහා අස්ථාන කුමරු

(07) ක්‍රි.ව. 1815 දී උඩරට රාජධානිය අත්පත් කරගත් බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයා කවුරුන් ද?

(1) ෆෙඩ්රික් නෝර්ත් (2) ටොරිංටන් සාමි
(3) තෝමස් මෙට්ලන්ඩ් (4) රොබට් බ්‍රවුන්රිග්

(08) කොළඹ තරුණ බෞද්ධ සංගමය පිහිටුවීමට පුරෝගාමී වූ පුද්ගලයා කවුරුන් ද?

(1) පියදාස සිරිසේන මහතා (2) අනගාරික ධර්මපාලතුමා
(3) ඩී.බී.ජයතිලක මහතා (4) ජෝන් ද සිල්වා මහතා

(09) මෙරට දේශීය කෘෂිකර්මාන්තය පිළිබඳ සැලකිලිමත් වෙමින් වාරි මාර්ග ප්‍රතිසංස්කරණයට යොමු වූ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරු හා එම වාරිමාර්ග නිවැරදිව දක්වෙන පිළිතුර තෝරන්න.

| | | |
|---|---|---|
| 1. හෙන්රි වෝඩ් | A - | වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිහිටුවීම |
| 2. හර්කියුලිස් රොබින්සන් | B - | කන්තලේ වැව ප්‍රතිසංස්කරණය කිරීම |
| 3. විලියම් ග්‍රෙගරි | C - | වාරි කර්මාන්ත පිළිබඳ සොයා බැලීමට කාරක සභාවක් පත් කිරීම |
| 4. වෙස්ට් රිජ්වේ | D - | තිස්සමහාරාම වැව ප්‍රතිසංස්කරණය කිරීම |

(1) BDCA (2) ACDB (3) CDBA (4) CBAD

(10) A - පරමේශ්වර විද්‍යාලය පිහිටුවීම

B - කෘෘව් මැකලම් ව්‍යවස්ථාදායක සභාවේ ප්‍රථම උගත් ශ්‍රී ලාංකිකයා වීම

ඉහත සේවාවන් සිදුකරමින් ආගමික පුනර්ජීවන ව්‍යාපාරයේ වැදගත් මෙහෙවරක් ඉටුකළ පුද්ගලයා වන්නේ,

(1) පොන්නම්බලම් අරුණාචලම් මහතා ය. (2) පොන්නම්බලම් රාමනාදන් මහතා ය.
(3) ටී.බී.ජයා මහතා ය. (4) ඔරාබි පාෂා මහතා ය.

(11) ඉංග්‍රීසීන් ඉන්දියාවට පැමිණ පළමුවරට වෙළෙඳ ගබඩාවක් ඉදිකලේ කුමන ස්ථානයක ද?

(1) සුරාට් (2) අලහාබාද් (3) ගුජරාට් (4) කරිකාල්

(12) බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරට වතු වගාවේ දියුණුවට බලපෑ ප්‍රධාන හේතුවක් වන්නේ මින් කුමක් ද?

(1) රට තුළ ආදායමට වඩා වියදම ඉහළ යාම
(2) දුම්රිය හා මහා මාර්ග පහසුකම් දියුණුවීම
(3) කෝල්බෲක් ප්‍රතිසංස්කරණවල බලපෑම
(4) වතු වගාවට උචිත භෞතික හා දේශගුණ සාධක පැවතීම

(13) ක්‍රි. ව. 1818 නිදහස් සටනට නායකත්වය ලබාදුන් දෙදෙනෙකු පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) වීරපුරන්අප්පු , ඩිංගිරාල (2) මඩුගල්ලේ දිසාව, වීර පුරන්අප්පු
(3) කැප්පෙටිපොළ නිලමේ, ඩිංගිරාල (4) කැප්පෙටිපොළ නිලමේ, මඩුගල්ලේ දිසාව

(14) ඉංග්‍රීසීන් ඉන්දියාවට පැමිණෙන විට එහි ශක්තිමත්ව පැවති මූගල් අධිරාජ්‍යයේ පාලකයා කවුරුන් ද?

(1) ඖරංසෙබ් (2) ජහන්ගීර් (3) සාජහන් (4) අක්බාර්

(15) ක්‍රි. ව. 1873 දී මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන පිහිටුවීමට පුරෝගාමී වූ භික්ෂූන් වහන්සේ කවුරුන් ද?

(1) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි (2) වාරියපොළ ශ්‍රී සුමංගල හිමි

(3) වස්කඩුවේ සුභූති හිමි (4) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි

(16) දේශීය සංස්කෘතිය ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ වලිසිංහ හරිස්චන්ද්‍ර මහාගෙන් සිදු වූ සේවාවක් වන්නේ මින් කුමක් ද?

(1) ඉන්දියාවේ බෞද්ධ පූජනීය ස්ථාන රැක ගැනීමට කටයුතු කිරීම

(2) අනුරාධපුරයේ බෞද්ධ පූජනීය ස්ථාන රැක ගැනීමට කටයුතු කිරීම

(3) ප්‍රබන්ධ රචනා කරමින් දේශීය සංස්කෘතියේ අගය මතුකර දැක්වීමට කටයුතු කිරීම

(4) ඓතිහාසික සිද්ධීන් ඇතුළත් නාට්‍ය රචනා කිරීම

(17) ඉන්දියාව පැමිණි බටහිර ජාතීන් වෙරළබඩ ප්‍රදේශවල පිහිටුවා ගත් වෙළෙඳ බලකොටු නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

| | | |
|---|---|---|
| 1. පෘතුගීසි | A - | ඔරිස්සා |
| 2. ලන්දේසි | B - | ගෝව |
| 3. බ්‍රිතාන්‍ය | C - | පොන්ඩිචෙරි |
| 4. ප්‍රංශ | D - | මදුරාසි |

(1) CABD (2) DCBA (3) ABCD (4) BADC

(18) පෙරදිග ඉන්දියානු වෙළෙඳ සමාගමේ පාලනය අවසන් කොට ඉන්දියාව පාලනය බ්‍රිතාන්‍ය රජය වෙතට පවරා ගැනීම සිදුවූයේ කුමන සිදුවීමෙන් පසුව දැයි තෝරන්න.

(1) 1857 සිපොයි කැරැල්ලෙන් පසු

(2) ඉන්දියාවේ ප්‍රංශ බලය දුර්වල වීමෙන් පසු

(3) ඉන්දියාවේ මූගල් අධිරාජ්‍ය පරිහානියෙන් පසු

(4) බහදුර්ෂා ඉන්දියාවේ අධිරාජයා ලෙස ප්‍රකාශ කිරීමෙන් පසු

(19) බ්‍රිතාන්‍යයන් ඉන්දියාවේ වෙරළබඩ ප්‍රදේශවල බලය පිහිටුවා ගැනීමේ දී වඩාත් වාසිදායක කරුණක් වූයේ මින් කුමක් ද?

(1) ඖරංෂෙබ් මිය යාමෙන් මූගල් අධිරාජ්‍ය දුර්වල වීම

(2) ඉංග්‍රීසීන් සතුව පැවති ප්‍රබල නාවික ශක්තිය

(3) ස්වාධීන රාජ්‍ය අතර එක්සත් බවක් නොමැතිවීම

(4) එංගලන්ත ආණ්ඩුව වෙළෙඳ සමාගමට සහාය ලබාදීම

(20) ඉන්දියානු ජාතික සංගමය පිහිටුවීමට පුරෝගාමී මෙහෙවරක් ඉටුකළ පුද්ගලයා වන්නේ,

(1) ඩබ්ලිව්. සි. බෙනර්ජි ය. (2) ඔක්ටේවියන් හියුම් ය.

(3) මහත්මා ගාන්ධි ය. (4) ජවහර්ලාල් නේරු ය.

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

* පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.

* අනිකුත් ප්‍රශ්න අතරින් හතරකට පිළිතුරු සපයන්න.

* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

---




(01) (i) ඉන්දියානු සිතියමේ දැක්වෙන පහත ස්ථාන නම් කරන්න.

A - ....................................

B - ....................................

C - ....................................

D - ....................................

(ලකුණු 4 x 2 = 08)



(ii) A. මෙම නිර්මාණය නම් කරන්න.

B. මෙය පිහිටා ඇති රට කුමක් ද?

C. මෙම නිර්මාණය ඉදිකළ රජතුමා කවුරුන් ද?

D. මෙම අයත්වන්නේ කුමන අධිරාජ්‍යයට ද?

(ලකුණු 04)



(iii) A. මෙම පුද්ගලයා නම් කරන්න.

B. මෙතුමා කුමන ජාතිකයෙක් ද?

C. මෙතුමාගේ මූලිකත්වයෙන් ඇරඹි සමාගම කුමක් ද?

D. මෙතුමාගේ මූලිකත්වයෙන් ආරම්භ කළ පාසලක් නම් කරන්න. (ලකුණු 04)

(02) (i) පහත දැක්වෙන වර්ෂවලදී ලන්දේසීන් සමඟ ගිවිසුම්වලට එළඹි උඩරට පාලකයින් නම් කරන්න.

A. ක්‍රි.ව. 1638 B. ක්‍රි.ව. 1766 (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ ලන්දේසීන් යටතේ පැවති පාලන ප්‍රදේශ කොටස් තුනකට බෙදා තිබිණි. ඉන් දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කරගත් ලන්දේසීන් සිය ආගම් ප්‍රචාරයට හා අධ්‍යාපන කටයුතු සඳහා ගත් ක්‍රියාමාර්ග එක බැගින් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(03) (i) ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ඉංග්‍රීසි වෙළෙඳ සමාගම යටතේ පැවති සමයේ ඇතිවූ පහත සිද්ධීන් සම්බන්ධ නාමයන් ලියා දක්වන්න.

A - බදු අයකිරීමට මදුරාසියෙන් ගෙන්වාගත් නිලධාරීන්

B - වෙළෙඳ සමාගමේ පාලනයට විරුද්ධව ඇති වූ කැරැල්ල පිළිබඳ සොයා බැලීමට පැමිණි කොමිසම (ලකුණු 02)

(ii) උඩරට රාජධානිය තුළ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු හා මහජනතාව අතර අර්බුද ඇතිවීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) උඩරට රාජ්‍ය යටත් කර ගැනීමේ දී ඉංග්‍රීසීන් අනුගමනය කළ උපායශීලී ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(04) (i) බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරට කිතු දහම ප්‍රචාරය කිරීම සඳහා පැමිණි මිෂනාරි සමාගම් දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) මිෂනාරි සමාගම් තම ආගම ප්‍රචාරය කිරීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) ඉංග්‍රීසීන් කිතු දහම ප්‍රචාරයට අනුගමනය කළ ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(05) (i) බෞද්ධ පුනරුද ව්‍යාපාරයට නායකත්වය දෙමින් පහත කාර්යයන් ඉටුකළ පුද්ගලයින් කවුරුන්දැයි සඳහන් කරන්න.

A. ලංකෝපකාර මුද්‍රණාලය ආරම්භ කිරීම

B. පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන ආරම්භ කිරීම (ලකුණු 02)

(ii) ඉස්ලාම් පුනර්ජීවන ව්‍යාපාරයට නායකත්වය දුන් එම්.සී.සිද්දිලෙබ්බේ මහතාගෙන් සිදු වූ සේවාවන් දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) හින්දු පුනර්ජීවන ව්‍යාපාරයට නායකත්වය සපයන ලද පුද්ගලයෙකු සඳහන් කොට එතුමාගෙන් ඉටුවූ සේවාවන් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(06) (i) ඉන්දියාව තුළ ඉංග්‍රීසි බලය පිහිටුවීමේ ක්‍රියාවලියේ දී අනුගමනය කළ උපායශීලී ප්‍රතිපත්ති දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) ක්‍රි.ව. 1857 සිපොයි කැරැල්ලට ඇතිවීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) ක්‍රි. ව. 1857 කැරැල්ල අසාර්ථක වීමට බලපෑ හේතු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(07) (i) ඉන්දියානු ජාතික සංගමයේ

a - මධ්‍යස්ථ මතවාදී නායකයෙකු

b - අන්තවාදී නායකයෙකු නම් කරන්න. (ලකුණු 02)

(ii) ඉන්දියානුවන් තුළ දේශනුරාගය වර්ධනය වීමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) ඉන්දියානු නිදහස් ව්‍යාපාරය තුළ මහත්මා ගාන්ධිතුමාගේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක කළ පහත දැක්වෙන සටන් ව්‍යාපාර කෙටියෙන් පැහැදිලි කරන්න.

A. සහයෝගිතා වර්ජනය

B. සිවිල් නීති කඩකිරීමේ ව්‍යාපාරය (ලකුණු 05)